## පළමුවන දේව ප්‍රකාශනය

2 වංශාවලිය 36:14, 16, 19-23

වංශාවලිය දෙවන පොතෙන් උපුටා ගත් කොටසකි.

**(දේව ජනතාවේ වහල්කමින් හා නිදහස්වීමෙන් දේව උදහස හා කරුණාව හෙළිවේ.)**

පූජකයන්ගේ සියලු ප්‍රධානීහු ද සෙනග ද ජාතීන්ගේ සියලු පිළිකුල් ක්‍රියා හැටියට බොහෝ සේ අපරාධ කරමින්, සමිඳාණන් වහන්සේ ජෙරුසලමෙහි විශුද්ධ කළ උන්වහන්සේගේ මාළිගාව අපවිත්‍ර කළෝ ය. එහෙත් පිළියමක් නැති තරමට සමිඳාණන් වහන්සේගේ කෝපය තමන්ගේ සෙනඟට විරුද්ධ ව පැමිණෙන ලෙස ඔව්හු දෙවියන් වහන්සේගේ පණිවුඩකාරයන්ට සරදම්කර, උන්වහන්සේගේ වචන සුලුකර, උන්වහන්සේගේ දිවැසිවරුන්ට නින්දා කළෝ ය.

ඔව්හු දෙවියන් වහන්සේගේ මාළිගාව දවා දමා ජෙරුසලමේ පවුරු කඩා, එහි සියලු මාළිගා ගින්නෙන් දවා එහි තිබූ සියළු අනර්ඝ බඩු විනාශ කළහ. ඔහු කඩු පහරින් නොමළ අය බබිලෝනියට ගෙන ගියේය. පාර්සිවරුන් රජකමට පත්වීම දක්වා ඔහුටත්, ඔහුගේ පුත්‍රයන්ටත් ඔව්හු දාසයන් ව සිටියෝ ය. මෙසේ වූයේ ජෙරමියාගේ මුඛයෙන් කියවන ලද සමිඳාණන් වහන්සේගේ වචනය සම්පූර්ණ වන පිණිස ය. ඒ වචනය නම්, "නොපවත්වන ලද සබත් විශ්‍රාමය පිරිමසන පිණිස සැත්තෑ අවුරුද්දක් දේශය පාළු වනු ඇත." යන්නයි. එහෙත් සමිඳාණන් වහන්සේ ජෙරමියාගේ මුඛයෙන් කියෙවූ වචනය සම්පූර්ණ වන පිණිස පාර්සියාවේ රජ වූ සයිරස්ගේ පළමුවන අවුරුද්දේ දී සමිඳාණන් වහන්සේ පාර්සියාවේ රජ වූ සයිරස්ගේ සිත පෙළඹවූ සේක. ඔහු වනාහි ප්‍රකාශයක් කරමින්, "ස්වර්ගයෙහි දෙවි සමිඳාණන් වහන්සේ පොළොවේ සියලු රාජ්‍යයන් මට දී තිබේ. තවද, උන්වහන්සේ ජුදහි තිබෙන ජෙරුසලමෙහි උන්වහන්සේට මාළිගාවක් ගොඩනගන්නට මට අණකර තිබේ. උන්වහන්සේගේ මුළු සෙනඟගෙන් ඔබ අතර සිටින්නේ කවරෙක් ද? ඔහු සමග ඔහුගේ දෙවි සමිඳාණන් වහන්සේ වැඩ සිටින සේක්වා! ඔහු එතැනට යේවා යි පාර්සියාවේ සයිරස් දන්වන්නේය" කියා තමාගේ රාජ්‍යය මුළුල්ලෙහි ප්‍රසිද්ධ කොට ලියවිල්ලෙනුත් එය පතළ කරවීය.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 137:1-6

පිළිතුර: විදේශයක දී සමිඳුන්ගේ ගීතය කෙසේ ගයමු ද?

ගීය: බබිලෝන්හි ගං තෙරවල අපි හිඳගතිමු. සියොන් කන්ද සිහි වූ විට අපි හඬා වැළපුනෙමු. එහි බට පඳුරුවල අපේ වීණා එල්ලා තැබීමු.

එසේ කළේ අපේ වහල්කමට ගෙන ගිය අය ගැයුම් වැයුම් කරන ලෙස අපට බල කළ බැවිනි. අපට පීඩා කළ අය සියොන් ගීයක් ගයා ඔවුන් විනෝද කරවන ලෙස අපෙන් ඉල්ලූ බැවිනි.

විදේශයක දී සමිඳුන්ගේ ගීතය අපි කෙසේ ගයමු ද? එම්බා ජෙරුසලම, තී මට අමතක වී නම් මගේ දකුණත වියළී යේවා! මම තී සිහිනොකරම් නම්, මාගේ පරමානන්දය මෙන් ජෙරුසලම නොසලකම් නම් මාගේ දිව ගොළු වේවා!

## දෙවන දේව ප්‍රකාශනය

එපේසි 2:4-10

පාවුලු තුමන් විසින් එපේසිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**(පාපය මගින් මරණයට පත් වූ අපව දෙවියන් වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේ සමග ජීවත් කර වදාළ සේක.)**

දයාවෙන් සමෘද්ධ වූ දෙවියන් වහන්සේ, අධික ප්‍රේමයකින් අපට ප්‍රේම කළ බැවින්, අපේ වැරදි ක්‍රියා හේතු කොටගෙන, අප මැරී සිටිය දී පවා, ක්‍රිස්තුස් වහන්සේ සමග අප ජීවත් කර වදාළ සේක. ඔබ ගැළවී සිටින්නේ දේව වරප්‍රසාදයෙන් ය. තවද දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළින් උන්වහන්සේ සමග අප උත්ථාන කර උන්වහන්සේ සමග සග ලොවෙහි අපට අසුන් ගැනීමට සැලසූ සේක. එසේ කළේ ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ අපට දක්වූ කරුණාව කරණකොටගෙන උන්වහන්සේගේ වරප්‍රසාදයේ මහා ධන සම්භාරය මතු යුගවලට පෙන්වනු පිණිස ය. ඔබ ගැළවී සිටින්නේ දේව වරප්‍රසාදය මගින් වූ ඇදහීම කරණකොටගෙන ය. එය ඔබගේම ක්‍රියාවක් නොව දෙවියන් වහන්සේගේ දීමනාව ය. ගැළවීම, පුණ්‍ය ක්‍රියාවල ප්‍රතිඵලයක් නොවන බැවින්, කිසිවෙකුට පාරට්ටුවට ඉඩක් නැත. මන්ද, අපි වනාහි යහපත් ක්‍රියා කරන පිණිස දෙවියන් වහන්සේ විසින් ක්‍රිස්තුස් වහන්සේ තුළ මවනු ලැබූ මැවිලි වෙමු. ඒ යහපත් ක්‍රියා කරන පිණිස දෙවියන් වහන්සේ කල් තියා අප සූදානම් කළසේක.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

ජොහන් 3:16

ප්‍රශංසාවත් ගෞරවයත් නිති ඔබටම වේවා ජේසු ස්වාමිනී !

"දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක් ද කීවොත්, ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් වුව ද ලොවට දෙවා වදාළ සේක. උන්වහන්සේ අදහන සියළු දෙනා ම නොමැරී සදාතන ජීවනය ලබන්නේ ය.".

ප්‍රශංසාවත් ගෞරවයත් නිති ඔබටම වේවා ජේසු ස්වාමිනී !

## ශුද්ධවූ සුවිශේෂය

ජොහන් 3:14-21

ජොහන් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**("මේ දේව මාලිගාව කඩාදමා තෙදිනකින් එය මම ගොඩනගන්නෙමි.")**

"පාළුකරයේ දී මෝසෙස් සර්පයා එසවූ ලෙස ම මනුෂ්‍ය පුත්‍රයාණන් ද, උන්වහන්සේ කෙරෙහි අදහා ගන්නා සෑම දෙන ම සදාතන ජීවනය ලබන පිණිස, ඔසවනු ලබන්නට ඕනෑ ය. දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක් ද කීවොත්, ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් වුව ද ලොවට දෙවා වදාළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහන සියළු දෙනා ම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිස ය. දෙවියන් වහන්සේ ස්වකීය පුත්‍රයාණන් ලොවට එවා වදාළේ, ලෝකයා විනිශ්චය කරන පිණිස නොව උන්වහන්සේ කරණ කොටගෙන ලෝකයා ගළවනු පිණිස ය. උන්වහන්සේ අදහා ගන්නා විනිශ්චය කරනු නොලැබේ. අදහා නොගන්නා දෙවියන් වහන්සෙගේ ඒකජාතක පුත්‍රයාණන් අදහා නොගන්නා බැවින් දැනටම විනිශ්චය ද ලබා ඇත." විනිශ්චය නම් මෙය. ලෝකයට ආලෝකය පැමිණ තිබේ. එහෙත්, තමන්ගේ ක්‍රියා නපුරු බැවින් මනුෂ්‍යයෝ ආලෝකය වඩා අන්ධකාරයට ප්‍රිය කළ හ. නපුරු ක්‍රියා කරන සෑම දෙනාම ආලෝකයට ද්වේශ කරති. ඔවුන්ගේ ක්‍රියා එළි වන බැවින් ඔව්හු ආලෝකයට නොපැමිණෙති. එහෙත්, සත්‍ය දේ කරන තැනැත්තා තමගේ ක්‍රියා දෙවියන් වහන්සේට කීකරු ව කරන ලද බව පෙනෙන පිණිස ආලෝකයට පැමිණේ ය"යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.